**ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම - 2017**

---

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු ප්‍රකාශනය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන ("සමාගම") ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා විසින් දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) වගන්තියෙහි අවශ්‍ය පරිදි පහත සඳහන් කරුණු දක්වමි.

අ. මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

ආ. - විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | |
| (i) මාර්ගෝපදේශ අංක 4.2.2 | සෑම මාසික මණ්ඩල රැස්වීමකදීම මූල්‍ය හා භෞතික වශයෙන් වූ මාසික කාර්ය සාධන ප්‍රකාශ, මෙහෙයුම් ප්‍රකාශ, මුදල් ප්‍රවාහ ප්‍රකාශ, ද්‍රවශීලතා ප්‍රකාශ, ණය ගැනීම් සහ සේවක තනතුරු, නව බඳවා ගැනීම් ඇතුළුව මානව සම්පත් පිළිබඳ ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඉදිරිපත් කර නොමැත. |
| (ii) මාර්ගෝපදේශ අංක 4.3 | අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර්තා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා හට රැස්වීමෙන් දින 10ක් ඇතුලත යැවිය යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මාර්ගෝපදේශ අංක 5.1.1 | සමාගම වසර 3 ක් සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙල කළ යුතු අතර එය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන සංයුක්ත සැළැස්මේ පිටපත් යාවත්කාලීන වාර්ෂික අයවැය සමග මූල්‍ය වර්ෂයේ ආරම්භයට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම එම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (iv) | මාර්ගෝපදේශ අංක 5.2.2(ආ) | 2017 වර්ෂය තුළ රු. මිලියන 10 ඉක්මවූ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ එකඟතාවය සමාගම විසින් ලබාගෙන නොතිබුණි. |
| (v) | මාර්ගෝපදේශ අංක 5.2.4 හා 5.2.5 | මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර 2017 වර්ෂයේ කෙටුම්පත් අයවැය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත්, එය 2017 දෙසැම්බර් මාසයේදී අනුමත කර තිබුණි.<br><br>තවද, මාර්ගෝපදේශය මගින් නියම කර ඇති පරිදි සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අයවැයේ පිටපත් රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (vi) | මාර්ගෝපදේශ අංක 9.2 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරය යටතේ අනුමත කාර්ය මණ්ඩලයක් සහිතව ලියාපදිංචි කර ඇති සංවිධාන ව්‍යුහයක් සමාගම සතුව නොපවතින අතර නව සේවක පිරිසක් බඳවා ගැනීමේදී හෝ අතිරික්ත සේවක සංඛ්‍යාවක් සිටින අවස්ථාවන් වලදී සමාගම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගෙන නොතිබුණි. |
| (vii) | මාර්ගෝපදේශ අංක 9.3 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත අමාත්‍යාංශය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටියක් සමාගම සතුව නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පසුගිය වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය වූ රු.මිලියන 1,785.65 ට එරෙහිව සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් කටයුතු මගින් රු.මිලියන 1,705.17 ක බදු පෙර ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 80.48 ක අඩුවීමක් සිදු වී තිබුණි. 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභය සහ ශුද්ධ ලාභය පිළිවෙලින් සියයට 0.5 කින් සහ සියයට 20 කින් අඩු වී පැවතිණි. පෙර වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම් වැඩිවීම මෙම පිරිහීමට හේතු වී ඇත.

කෙසේ වුවද, සේවක වේතන ගෙවීම,රජයට බදු හා විශේෂ ගාස්තු ගෙවීම සහ ජංගම නොවන වත්කම් ක්ෂයවීම ආදිය සැළකීමේ දී සමාගම විසින් රු. මිලියන 2,138.13 ක දායකත්වයක් සමාලෝචිත වර්ෂය තුළදී රටට ලබා දී තිබූ අතර පෙර වර්ෂය සඳහා එම වටිනාකම රු. මිලියන 2,169.3 ක් විය.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

විගණනයට ලද තොරතුරු වලට අනුව 2017 සහ පසුගිය වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත සඳහන් පරිදි වේ,

| **ලාභදායිත්ව අනුපාත (ප්‍රතිශත)** | **2017** | **2016** |
|---|---|---|
| දළ ලාභ අනුපාතය | 82.75 | 83.48 |
| ශුද්ධ ලාභ අනුපාතය | 67.63 | 85.33 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 12.73 | 18.57 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය | 14.62 | 17.06 |
| **ද්‍රවශීලතා අනුපාත (වාර ගණන)** | | |
| ජංගම වත්කම් අනුපාතය | 29.59 | 13.88 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 29.59 | 13.88 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 0.8 කින් සහ සියයට 20.7 කින් අඩු වී ඇති අතර ද්‍රවශීලතා අනුපාත වල වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම, ඉකුත් වර්ෂයට සාපේක්ෂව වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ යෙදවූ ප්‍රාග්ධනය මත මත ප්‍රතිලාභ අනුපාතය පිළිවෙලින් සියයට 31.4 කින් සහ සියයට 14.3 කින් අඩු වී ඇත. එබැවින් සමාගමේ ලාභදායීත්වය පහල ගොස් තිබුණ ද ද්‍රවශීලතා තත්ත්වයෙහි වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 3.2.2 දීර්ඝකාලීනව පියවා නොගත් අත්තිකාරම්

2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත අනුව ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව විභේදනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ඉන්වෙස්මන්ට්ස් හෝල්ඩිංස් ලිමිටඩ් ආයතනය සංස්ථාගත කිරීම උදෙසා රු. මිලියන 100 ක පොලී රහිත අත්තිකාරම් මුදලක් ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනාවක් 2014 වර්ෂයේ දී සම්මත කර තිබූ අතර එම මුදල, මුදල් මගින් හෝ ලාභාංශ පියවීම මගින් හෝ 2015 අගෝස්තු 31 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා ඉන්වෙස්මන්ට්ස් හෝල්ඩිංස් ලිමිටඩ් ආයතනය විසින් ආපසු ගෙවිය යුතු වේ. කෙසේ වුවද, 2018 අගෝස්තු 20 වන විගණිත දිනය දක්වා එම මුදල ආපසු අය කර ගෙන නොතිබුණි.

ඉහත යෝජනාවට අනුව, ශ්‍රී ලංකා ඉන්වෙස්මන්ට්ස් හෝල්ඩිංස් ලිමිටඩ් ආයතනය සංස්ථාගත කිරීමේදී, එක් පුද්ගලයකුට එක් සාමාන්‍ය කොටස බැගින් වන පරිදි සහ භාණ්ඩාගාර ලේකම් වෙත එම කොටස් ප්‍රායෝගිකව හැකි ඉක්මනින් පැවරීමේ අවබෝධය මත පුද්ගලයින් දෙදෙනෙකු ආරම්භක කොටස් හිමියන් ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වුවද, සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ වාර්තාවලට අනුව ඉහත සඳහන් කළ කොටස් දෙක භාණ්ඩාගාර ලේකම් වෙත 2018 අගෝස්තු 20 වන විගණිත දිනය දක්වා පවරා නොතිබුණි.

## 4. තිරසාර සංවර්ධනය

### 4.1. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගම විසින් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සංධිස්ථානයන්ද ඉලක්ක මත ළඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය ඕනෑම සංවිධානයක කළමනාකරණය වෙනුවෙන් වැදගත් සේවාවන් ගණනාවක් සපයනු ලබයි. වංචා හඳුනා ගැනීම සහ වැළැක්වීම, අභ්‍යන්තර පාලනය පරීක්ෂා කිරීම සහ සංවිධානයේ ප්‍රතිපත්ති සහ රජයේ රෙගුලාසි වලට අනුකූල වීම අධීක්ෂණය කිරීම මීට ඇතුළත් වේ. එබැවින් අභ්‍යන්තර විගණනය සංවිධානයේ සංවර්ධනය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සමාගමේ අභ්‍යන්තර විගණන ක්‍රියාකාරිත්වය පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණකවරයා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඍජුවම වගකිව යුතු වුවද, විගණනයට ලැබී ඇති සංවිධාන සටහනට අනුව, අභ්‍යන්තර විගණකවරයා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයාට ඍජුවම වගකීමට බැඳේ.

(ආ) අභ්‍යන්තර විගණන ක්‍රියා පටිපාටිය හෝ අත්පොත සමාගම විසින් හඳුන්වා දී නොමැත.

(ඈ) 2017 වර්ෂයෙහි අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර සියලු වැදගත් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නිසි අවදානම් තක්සේරුවක් කර නොමැත.

(ඇ) අභ්‍යන්තර විගණනයේ නිරීක්ෂණ සහ නිර්දේශ නිතිපතා ඇගයීමට ලක් කර නොතිබුණු අතර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට ද වාර්තා කර නොමැත.

(ඉ) විගණනයට ලද තොරතුරු අනුව සමහර ක්ෂේත්‍ර ආවරණය අභ්‍යන්තර විගණනයට සීමා කර තිබුණි. උදා: සේවක වේතන.

**5.2 විගණන කමිටුව**

**-----------------**

2003 ජුනි 02 දිනැති අංක. පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි සහ 2010 දෙසැම්බර් 14 දිනැති අංක. පීඊඩී/55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි විධිවිධාන වලට අනුව, සමාගම විසින් විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණන කාලය තුළ පද්ධතිවල සහ පාලනයේ දක්නට ලැබෙන දුර්වලතා වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත් වේ.